දුරකථන අංකය
தொலைபேசி
Telphone
041 - 2220174

ෆැක්ස්
பெக்ஸ்
Fax
041 - 2234412

විද්‍යුත් තැපැල්
மின் அஞ்சல்
E-mail
sdig.matara@gmail.com
sdig.sp@police.lk

මගේ අංකය
எனது இல
My No
S/DIG/SP/OUT/ /2023

ඔබේ අංකය
உமது இல
Your No

දිනය
திகதி
Date
2023.04.

# ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය

දකුණු පළාත - (නූපේ, මාතර)

## சிரேஷ்ட பிரதி பொலிஸ் மாஅதிபர் காரியாலயம்

தென் மாகாணம் - (நுபே, மாத்தறை)

## OFFICE OF THE SENIOR DEPUTY INSPECTOR GENERAL OF POLICE

SOUTHERN PROVINCE - (Nupe, Matara)

---

වියානි ගුණතිලක මහතා,
ලේකම්,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය.

**අනීතික ස්ථාන මාරුවීම් නියෝගය - බලාතික්‍රමණය**

2023.04.25 අද දින පොලිස්පතිගේ අත්සනින් යුතු ව TTM 496/ CTTM 439 යටතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ වන මා දකුණු පළාතේ සිට නැගෙනහිර පළාතට ස්ථාන මාරු කර ඇත. එම නියෝගයේ පහත පරිදි සඳහන් ව ඇත.

**''02/08/SGO/02/2023 දරණ 2023.04.25 දිනැති ලිපිය මගින් ජාතික පොලිස් කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යටත් ව සේවා අවශ්‍යතාවය මත මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කර ඇති පහත සඳහන් ස්ථාන මාරු කිරීම් වහාම ක්‍රියාත්මක කිරීමට මෙයින් නියෝග කරමි.''**

එම නියෝගයේ පිටපතක් මේ සමග අමුණා ඇත.

එහි සඳහන් කර ඇත්තේ ජාතික පොලිස් කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යටත් ව, සේවයේ අවශ්‍යතාවය මත, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් ස්ථාන මාරුවීම් අනුමත කර ඇති බවයි.

අපගේ රටෙහි උත්තරීතර නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පොලිස් නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සිදු කිරීමට බලය ලබා දී ඇත්තේ ජාතික පොලිස් කොමිෂන් සභාවට වන අතර, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්ගේ ස්ථාන මාරුවීම් අනුමත කිරීමට ඔබ වෙත කිසිදු බලයක් ලබා දී නොමැති බව කාරුණිකව දන්වා සිටිමි. තව ද, ස්ථාන මාරුවීම් පටිපාටියේ ''ආවරණ අනුමැතිය'' යන්නෙන් සිද්ධාන්තයක් නොමැත.

ඒ අනුව, පොලිස් කොමිෂන් සභාව මෙම ස්ථාන මාරුවීම් අනුමත කර නොමැතිනම්, ස්ථාන මාරුවීම් නියෝගය අනීතික හා නීතියට පටහැනි නියෝගයක් වන අතර, එය බලාතික්‍රමණයකි.

පොලිස් ආඥා පනතේ 56 වැනි වගන්තිය අනුව සහ විජේසූරිය එදිරිව රජය 1974 NLR 25 නඩුවේ තීරණය අනුව අනීතික නියෝග ක්‍රියාත්මක කිරීමට මා බැඳී නොමැත.

ඒ අනුව, පොලිස් කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව ලබා දී ඇති එම ස්ථාන මාරුවීම් නියෝගය ක්‍රියාත්මක කිරීමට මා බැඳී නොමැති බව කාරුණිකව දන්වා සිටිමි.

අජිත් රෝහණ,
**ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති,**
**දකුණු පළාත.**

පිටපත් : 01. පොලිස්පති/ පොලිස් මූලස්ථානය - දැනගැනීම සඳහා,
02. ගොනුවට.

~C.K.N. - VPN~